# <u>දැන්වීමයි</u>

## <u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

මධ්‍යම පළාත් සභාවේ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු සඳහා පත් කිරීමට ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමට නියමිත තනතුරු

| අනු අංකය | තනතුර | තනතුර අයත් ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පළාත් ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන ශ්‍රේණිය II | SL 1 – 2006 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ සුදුසු අයෙකු නොමැති විටෙක ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක අයගේ ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ. | 01 |
| 02 | සහකාර පළාත් ආයුර්වේද කොමසාරිස් | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන ශ්‍රේණිය II | SL 1 – 2006 | | 01 |
| 03 | වෛද්‍ය අධිකාරී මූලික ආයුර්වේද රෝහල, දොළුව | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණිය | SL 2 – 2006 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම, අදාළ ශ්‍රේණියේ සුදුසු අයෙකු නොමැති විටෙක ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ අයගේ ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ. | 01 |
| 04 | වෛද්‍ය අධිකාරී මූලික ආයුර්වේද රෝහල, උතුරු මාතලේ | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණිය | SL 2 – 2006 | | 01 |
| 05 | කාර්ය භාර වෛද්‍ය නිලධාරී - පළාත් ආයුර්වේද නිෂ්පාදනාගාරය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණිය | SL 2 – 2006 | | 01 |
| 06 | කාර්ය භාර වෛද්‍ය නිලධාරී ග්‍රාමීය ආයුර්වේද රෝහල, ගෙලිඔය | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II/I ශ්‍රේණිය | SL 2 – 2006 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I/II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම | 01 |
| 07 | කාර්ය භාර වෛද්‍ය නිලධාරී ග්‍රාමීය ආයුර්වේද රෝහල, හඳගනාව | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II/I ශ්‍රේණිය | SL 2 – 2006 | | 01 |
| 08 | කාර්ය භාර වෛද්‍ය නිලධාරී ග්‍රාමීය ආයුර්වේද රෝහල, නිල්දණ්ඩාහින්න | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II/I ශ්‍රේණිය | SL 2 – 2006 | | 01 |

02. බඳවා ගැනීමේ ක්‍රමය

i. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ආයුර්වේද වෛද්‍ය සේවයේ අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පිළිවෙලින් ඉහත පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

ii. නියමිත සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් නොමැති විට පහළ ශ්‍රේණියක නිලධාරියෙකු තෝරාගැනීමට සිදුවුවහොත් පත් කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ රාජකාරී ඉටු කිරීමේ පදනම මතයි. ශ්‍රේණිගත සුදුසු නිලධාරීන් ලැබුණු අවස්ථාවක මෙම රාජකාරී ඉටු කිරීමේ පත් වීම් අවලංගු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම්

i. 2016.12.31 දිනට ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 08 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. යටත් පිරිසෙයින් එයින් වසර පහක (05) කාලයක් ආයුර්වේද රෝහලක හෝ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබිය යුතුය.

iii. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබිය යුතුය.

iv. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

v. අයදුම්පත් කැඳවන දිනයට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :- සුදුසුකම් සනාථ කෙරෙන සියළුම සහතික වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.**

04. අයදුම්පත් ඉදිරිපත් කිරීම

සියළුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2017.05.29 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) තම අයදුම්පත් "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 244, කටුගස්තොට පාර, මහනුවර." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ .................... තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. එක් නිලධාරියෙකු තනතුරු එකකට වඩා වැඩි සංඛ්‍යාවකට අයදුම් කරන්නේ නම් තම අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයැදුම්පත්, නියමිත ප්‍රමිතියෙන් බැහැර හා අසම්පූර්ණ අයැදුම්පත් හා අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම ගැන කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙම දැන්වීමේ සිංහල හා දෙමළ පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

2017.04.26 දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව